# නිවේදනය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 (1) ව්‍යවස්ථාව අනුව ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කරන ලද "හෝමියෝපති" නැමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.
ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීන්දු කර ඇත්තේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 (1) ව්‍යවස්ථාව අනුව නිර්දේශිත කාල සීමාව තුළ පෙත්සම ගොනු කිරීමට පෙත්සම්කරුවන් අසමත් වී ඇති බැවින් මෙම පෙත්සම ප්‍රතික්ෂේප කරන බවත් ශ්‍රේෂ්ඨාධිකරණය තීරණයක් ලබා දීමට කටයුතු නොකරන බවත්ය.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරමි.